# පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන සහකාර කොමසාරිස් සතු බලතල හා කාර්යභාරය

DRAFT

ආසියා පදනම

Australian Aid

The Asia Foundation

ආසියා පදනම මගින් ප්‍රකාශයට පත් කරන ලදි

පළමු සංස්කරණය,
© 2018, ආසියා පදනම

ISBN

කර්තෘ
එච්. ජී. සී. ජයතිස්ස
**උපදේශක ( නීති හා පළාත් පාලන )**

මුද්‍රණය කරන ලද්දේ
කොළඹ, ශ්‍රී ලංකාව

DRAFT

**ප්‍රකාශනය සම්බන්ධයෙන්: ඕස්ට්‍රේලියානු රජයේ සහයෝගීතාවය මධ්‍යයයේ කටයුතු කරන උප ජාතික පාලන වැඩසටහනේ ශාස්ත්‍රීය නිෂ්පාදන ගොනුවේ තවත් එක් ප්‍රකාශනයක් ලෙස මෙම ග්‍රන්ථය හැඳින්විය හැකිය. උප ජාතික පාලන වැඩසටහන ශ්‍රී ලංකාවේ පළාත් පාලනය සවිමත් කිරීමේ අරමුණින් පළාත් පාලන ආයතනයන්ගේ දරා ගැනීමේ ශක්තිය, නියෝජනය හා දුක් ගැහැට වලට පිළියම් යෙදීම යන සංරචකයන්ගේ ශක්‍යතාවය වර්ධනය කිරීම සඳහා අත්හදා බලන ලද මොඩියුලයන් හඳුන්වාදීම හා ආයතනගත කිරීම සඳහා කටයුතු කරයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ පළාත් පාලනයේ ප්‍රතිසංස්කරණයන් සඳහා උපාය මාර්ගයන් සංස්ථානය කිරීමත් ප්‍රධාන පාත්‍රයන්ගේ ධාරිතාව වර්ධනය කිරීමට අවශ්‍ය අත්හදා බලන ලද යාන්ත්‍රණයන්, ක්‍රියාවලීන් හා මොඩියුලයන් හඳුන්වාදීමත් ශක්තිමත් කිරීමත් සිදු කරයි.**

**සැ.යු. මෙම ග්‍රන්ථයේ සඳහන් කිසිවක් ඕස්ට්‍රේලියානු රජයේ මතය පෙන්නුම් නොකරන අතර එහි අවශ්‍ය යෙන්ම කතෘවරයාගේ පෞද්ගලික දෘෂ්ඨිකෝණය හා මතයන් පමණක් ගැබ් වේ.**

# පටුන


| | | | |
|---|---|---|---|
| හැඳින්වීම | | | |
| **01.** පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉතිහාසය හා විකාශය................................................................. | | | **7** |
| **02.** පළාත් පාලන දෙපාර්තමේන්තු බලධාරීන් සතු වගකීම් හා බලතල.............................................. | | | **8** |
| **03.** පළාත් පාලන දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා උප ප්‍රධානීන් තමන් සතු බලතල හා වගකීම් පිළිබඳ දැනුවත්වීමේ අවශ්‍යතාවය.............................................................. | | | **9** |
| **04.** පළාත් පාලන කොමසාරිස් වරයා වෙත පැවරී ඇති බලතල හා කාර්යභාරය............................................... | | | **9** |
| | **4.1** | මහා නගර සභා ආඥා පනත යටතේ පැවරී ඇති බලතල හා වගකීම................................. | **9-10** |
| | **4.2** | නගර සභා ආඥා පනත යටතේ පැවරී ඇති බලතල හා වගකීම්.......................................... | **11-14** |
| | **4.3** | **1987** අංක **15** දරණ ප්‍රාදේශීය සභා පනත යටතේ පැවරී ඇති බලතල හා වගකීම් ........................... | **14-17** |
| | **4.4** | **2012** අංක **22** දරණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ (සංශෝධන) පනත යටතේ පැවරී ඇති බලතල, වගකීම් හා කාර්ය භාරය....................... | **17** |
| **05.** පළාත් පාලන සහකාර කොමසාරිස් වරයා සතු බලතල හා වගකීම්........................................................... | | | **17** |
| | **5.1** | **255** අධිකාරය වූ නගර සභා ආඥා පනත යටතේ පළාත් පාලන සහකාර කොමසාරිස් වරයාට පැවරී ඇති බලතල........................................... | **17-18** |
| | **5.2** | **1987** අංක **15** දරණ ප්‍රාදේශීය සභා පනත යටතේ සහකාර කොමසාරිස් වරයාට පැවරී ඇති බලතල හා වගකීම්.................................... | **18-20** |


DRAFT

## ආසියා පදනම

ආසියා පදනම යනු ලාභ නොලබන ජාත්‍යන්තර සංවර්ධන සංවිධානයකි. නිරන්තර වෙනස්වීම් වලට භාජනය වන  හා සංවර්ධනය වෙමින් පවතින ආසියාවේ ජීවිත ශක්තිමත් කිරීම වෙනුවෙන් ආසියා පදනම කැපවී සිටී. දශක හයක් තුළ ලත් අත්දැකීම් හා පන්නරය හරහා හඳුනාගෙන වැඩිදියුණු කළ අරමුණු 5ක් යටතේ අප ආසියා කලාපයේ සංවර්ධන කටයුතු වල නියැළේ. ඒවා නමින් පරිපාලනය ශක්තිමත් කිරීම, කාන්තාවන් බලගැන්වීම , ව්‍යාපාර අවස්ථා විස්තාරණය කිරීම, පාරිසරික ඔරොත්තු දීම වර්ධනය කිරීම හා කලාපිය සහයෝගය වර්ධනය කිරීම වේ.

ආසියා පදනමෙහි  මව් සමාගම පිහිටා ඇත්තේ සැන් ෆ්‍රන්සිස්කෝ නුවර වන අතර ආසියාවේ හා වොෂින්ටන් DC හි පැතිර පවතින කාර්යාල 18ක් සමග ආසියා පදනම වැඩකටයුතු සිදු කරයි. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධතා පවත්වන ආසියා පදනමට ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය සංවර්ධන ආයතන,පදනම්,සහයෝගිතාවයන් හා තනි පුද්ගල ආදී වශයෙන් නොයෙකුත් ආයතන  හරහා ආධාර ගලාගෙන එයි.  2017 වර්ෂයේ අප ඇමරිකන් ඩොලර් මිලියන 83.7 ක් ඍජුවම සංවර්ධන ව්‍යාපෘති සඳහා යෙදවූ  අතර පෙළපොත් සහ අනෙකුත් අධ්‍යාපනික ද්‍රව්‍යයන් වෙනුවෙන්  ඇමරිකන් ඩොලර් මිලියන 8.7 ක් වැයකර ඇත.

## උප ජාතික පාලන වැඩසටහන

ආර්ථික වර්ධනයේ හා ආර්ථික ගතික ශක්ති වර්ධනයේ නැගී එන ආර්ථික කේන්ද්‍රයන් වන ද්වතීය නගරවල් වල ආර්ථික ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය උදෙසා ක්‍රියාකාරී ආර්ථික කේන්ද්‍ර සංකල්පය ගොඩනැගීම සඳහා ආසියානු පදනමේ ශ්‍රී ලංකා උප ජාතික පාලන වැඩසටහන පළාත් පාලන ආයතන නවයක මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ඇත. මෙම වැඩසටහනේ සමස්ත පුළුල් අරමුණ වනුයේ අත්දුටු අනුරූප බලාත්මක ලෙස ආයතනගත කිරීමයි.

## හැඳින්වීම

පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් සමීපතම ආසන්න බලධාරීන් ලෙස පළාත් පාලන ආයතන වලට අවශ්‍ය මඟ පෙන්වීම්, උපදෙස් දීම හා සහායවීම ඇතුළු අධීක්ෂණ කටයුතු සිදුකිරීමේ කාර්යභාරය පැවරී ඇත්තේ පළාත් පාලන කොමසාරිස්වරුන් හා සහකාර කොමසාරිස්වරුන් වෙතය. මේ සඳහා අවශ්‍ය බලතල ඒ ඒ පළාත් පාලන ආයතන සංස්ථාපිත අණපනත් වල සඳහන්ව ඇත.

මීට අමතරව පළාත් මට්ටමින් පළාත් පාලන විෂයට සම්බන්ධ පහත දැක්වෙන කටයුතු මෙම බලධාරීන් විසින් ඉටුකළ යුතුව ඇත.

i. පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීම
ii. පළාත් පාලන ආයතන සඳහා උපදේශන සේවය
iii. පළාත් පාලන අයතන වලට මූල්‍ය ආධාර ලබා දීම
iv. පළාත් පාලන ආයතන වල සංවර්ධන කාර්යයන් සමාලෝචනය කිරීම
v. පළාත් පාලන ආයතන වල පිරිස් කළමනාකරණය

ඉහත කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා තමන් වෙත ලිඛිත නීතිය මඟින් පැවරී ඇති බලතල පිළිබඳව දැනුවත්වීම හා ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගත යුතුව ඇත. එමෙන්ම බලතල ක්‍රියාත්මක කිරීමේදී තමන් වෙත පවරා නොමැති බලතල ක්‍රියාත්මක කිරීමට යාමෙන් හෝ වැරදි ලෙස ක්‍රියාත්මක කිරීමට යාම හේතුකොට ගෙන “ බලාතික්‍රමණය” (Ultra vires ) නම් වූ වරදට ලක්විය හැකිය.

එබැවින් මෙම කාර්යභාරය නියමිත පරිදි හා නෛතික විධිවිධානයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීමට පහසුවීම සඳහා ලිඛිත නීතියේ ( MCO, UCO & PS Act) විවිධ වගන්ති යටතේ දැක්වෙන බලතල හා කාර්යභාරය වෙන වෙනම සාරාංශගත කර මෙම ප්‍රකාශනය තුලට අන්තර්ගත කර ඇත. ඒ අනුව පළාත් පාලන කොමසාරිස්වරුන්ට හා සහකාර කොමසාරිස්වරුන්ට තමන් විසින් නෛතිකව ඉටුකළ යුතු වගකීම් හා කාර්යභාරයන් පිළිබඳව පහසුවක් ලැබේ යැයි අපේක්ෂා කරමි.

එච්.ජී.සී. ජයතිස්ස
උපදේශක ( නීති හා පළාත් පාලන )

DRAFT

## 01. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉතිහාසය හා විකාශය

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉතිහාසය හා විකාශය පිළිබඳව සාකච්ජා කිරීමේදී එවකට ඉංග්‍රීසි පාලන කාලයේ එනම් 1931 වර්ෂයේදී පත් කරන ලද ඩොනමෝර් කොමිසමේ නිර්දේශ අනුව ශ්‍රී ලංකාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. ඩොනමෝර් යුගයෙන් පසු පළාත් පාලන ක්‍රමය බොහෝ දුරට ව්‍යාප්ත වූ අතර මහා නගර සභා, නගර සභා, සුළුනගර සභා හා ගම්සභා යනුවෙන් පළාත් පාලන ආයතන 4 ක් රටපුරා ව්‍යාප්ත විය.

මෙම පළාත් පාලන ආයතන වලට උපදෙස් දීම, මඟ පෙන්වීම, සහායවීම මෙම පළාත් පාලන ආයතන වල කාර්යය අධික්ෂණය පළාත් පාලන දෙපාර්තමේන්තු වෙත පැවරුනු අතර දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස පළාත් පාලන කොමසාරිස් තනතුර බිහි කරන ලදී. ඉන් අනතුරුව 1946 අංක 57 දරණ පළාත් පාලන කොමසාරිස්වරුන් පත් කිරීමට අදාළ පනතින් ( Local Government – Administratiove Regions) පළාත් පාලන කොමසාරිස් තනතුරු තවදුරටත් තහවුරු විය.

එවකට කෙළඹ සිට ක්‍රියාත්මක වූ පළාත් පාලන දෙපාර්තමේන්තුව 13 වන ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනයට අනුකූලව පළාත් පාලන විෂය පළාත් සභාවලට පැවරීමත් සමගම වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ සියලු පළාත් ආවරණය වන පරිදි පළාත් මට්ටමින් දෙපාර්තමේන්තු 9 ක් බිහිකරලමින් පළාත් පාලන කොමසාරිස් වරුන් 9 දෙනෙකු හා දිස්ත්‍රික් මට්ටමින් සහකාර කොමසාරිස්වරුන්ද වශයෙන් ව්‍යාප්ත විය. පළාත් මට්ටමට ව්‍යාප්ත වූ පළාත් පාලන දෙපාර්තමේන්තුව පළාත් පාලන කොමසාරිස් හා සහකාර කොමසාරිස්වරුන්ට අණපනත් මඟින් ලැබී ඇති බලය 1989 අංක 12 දරණ ( ආනුශංගික විධිවිධාන) පනත මඟින් තහවුරු විය.

## 02. පළාත් පාලන දෙපාර්තමේන්තු බලධාරීන් සතු වගකීම් හා බලතල

<u>වගකීම්</u>

පළාත් පාලන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ පහත දැක්වෙන අරමුණු හා අපේක්ෂාවන් සාක්ශාත් කර ගැනීම උදෙසා කටයුතු කිරීමේ වගකීම දෙපාර්තමේන්තුවේ අදාල බලධාරින් වෙත පැවරේ.

i. පළාත් පාලන ආයතන වලට දැනුම සපයන නිළධාරි සංචිතයක් ලෙස කටයුතු කිරීම.

DRAFT

ii. මිතුරෙකු, හිතවතෙකු හා මඟ පෙන්වන්නෙකු යන ආකල්ප වලින් පළාත් පාලනය පෝෂණ කිරීමට උපකාරි වීම.

iii. පළාත් පාලන ආයතන වලට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබා කර දීම.

iv. පළාත් පාලන ආයතන ව්‍යුහයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අධීක්ෂණය හා කාර්ය සාධනය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

බලතල

i. පළාත් පාලන ආයතන සංස්ථාපිත නීතීන් වූ මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත හා ප්‍රාදේශීය සභා පනත යටතේ සෘජුවම බලතල පවරා ඇත. ඊට අමතරව, (අ) පවත්නා නීතීන් යටතේ ආණ්ඩුකාර වරයා හෝ විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරන නියමයක් මගින්ද බලතල පැවරීම්කර ඇත.

(ආ)පරිපාලනමය වශයෙන් පළාත් සභාව විසින් හෝ විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ලේකම්/හෝ වෙනත් රේඛීය අමාත්‍යාංශ ලේකම් වරුන් විසින් බලතල පවරනු ලැබු අවස්ථාද ඇත.

## 03. පළාත් පාලන දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා උප ප්‍රධානීන්තමන් සතු බලතල හා වගකීම් පිළිබඳ දැනුවත්වීමේ අවශ්‍යතාවය.

පළාත් පාලන ආයතනන වලට අවශ්‍ය උපදෙස් දීම, මඟ පෙන්වීම හා අධීක්ෂණයට අදාලව පහත දැක්වෙන නෛතික විධිවිධානයන් පිළිබඳ දැනුවත්වීම අත්‍යාවශ්‍ය කාරණයක් වේ.

i. උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
ii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ප්‍රතිපාදිත මූලික අයිතිවාසිකම්
iii. ස්වභාවික යුක්තියේ මූලධර්ම
iv. පළාත් පාලන ආයතන සංස්ථාපිත ප්‍රධාන නීතීන් සහ එකී නීතීන් යටතේ (MCO, UCO & PS Act.) ප්‍රකාශිත රෙගුලාසි නියෝග හා අතුරු නීති
v. පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනත යටතේ වන වගකීම් සහ කාර්යභාරය සහ
vi. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ඇති වගකීම් හා කාර්යභාරය.

පළාත් පාලන ආයතන සංස්ථාපිත ලිඛිත නීතියේ විධිවිධානයන්ට අනුකූලව පළාත් පාලන කොමසාරිස් හා සහකාර කොමසාරිස් සතු බලතල හා කාර්යභාරයන් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

## 04. පළාත් පාලන කොමසාරිසවරයා වෙත පැවරී ඇති බලතල හා කාර්යභාරය

පළාත් පාලන ආයතන වලට මඟ පෙන්වීම, උපදෙස් දීම හා සහායවීමේ ප්‍රමුඛ කාර්යභාරයට අමතරව ඒ ඒ පළාත් පාලන ආයතන සංස්ථාපිත අණ පනත් යටතේ පහත දැක්වෙන බලතල හා වගකිම් පළාත් පාලන කොමසාරිස්වරයා වෙත පැවරි ඇත.

## 4.1 මහා නගර සභා ආඥා පනත යටතේ පැවරී ඇති බලතල හා වගකීම්.

මහා නගර සභා ආඥා පනත යටතේ පළාත් පාලන කොමසාරිස්වරයාට පැවරී ඇති ව්‍යවස්ථාපිත බලතල ප්‍රමානය සීමා සහිතය.

| නෛතික යොමුව | බලතල හා කාර්යය |
|---|---|
| 190 වගන්තිය | මහා නගර සභා අරමුදලේ ගිණුම් සම්බන්ධයෙන් වූ ලැබීම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශය ගැසට් පත්‍රයේ පළ කිරීම |
| 317 (1) වගන්තිය | මහා නගර සභාව විසින් එක් එක් වර්ෂයක් තුලදී ක්‍රියාත්මක කර ඇති කටයුතු පිළිබඳව සාමාන්‍ය සමීක්ෂණයක් පවත්වා නිරීක්ෂණය වූ කරුණු හා තොරතුරු ඇතුලත් වාර්තාවක් පිළියෙල කර මහා නගර සභාවේ නගරාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. නගරාධිපතිවරයා විසින් එකී වාර්තාව ලැබීමෙන් පසු එලඹෙන රැස්වීමේදී එය සභාගත කළ යුතුය. |
| 317(2)(1) (අ) (ආ) (ඇ) වගන්තිය | ඉහත කී වාර්ෂික වාර්තාව සකස් කිරීමේදී සභාව විසින් පරිහරණය කරන හෝ පවත්වාගෙන යන හෝ නිශ්චල දේපලක් හෝ ආයතනයක් හෝ කිසියම් ව්‍යාපෘතියක් පරීක්ෂා කිරීම, මහා නගර සභාවක සන්තකයේ හෝ පාලනය යටතේ පවතින පොතක් හෝ ලේඛනයක් ඉල්ලා පරීක්ෂා කිරිම, හා අවශ්‍ය යැයි සලකනු ලබන තොරතුරු සපයන ලෙස මහා නගර සභාවට නියම කිරීම. |

- මීට අමතරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාට මධ්‍ය පාලනය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය බොහෝ විට පවරනු ලබන්නේ පළාත් පාලන කොමසාරිස්වරයා වෙත වේ.

## 4.2.නගර සභා ආඥා පනත යටතේ පැවරී ඇති බලතල හා වගකීම්

| නෛතික යොමුව | බලතල හා කාර්යය |
|---|---|
| 27(3) වගන්තිය | සභාපති ධූරය හා උප සභාපති ධූරය යන ධූර 2 ම හිස්ව ඇති අවස්ථාවක උපසභාපති ධූරය හිස් වීමත් නව සභාපතිවරයෙකු තෝරා පත්කර ගැනීමත් අතර කාල සීමාව තුල සභාවේ ලේකම් විසින් 193 වගන්තිය යටතේ සාදනු ලබන රීති වලින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට හා කොන්දේසි වලට යටත්ව සභාව වෙනුවෙන් වියදම් දැරීම පොදු අරමුදලින් ගෙවීම් කිරීම සභාපතිවරයාගේ |

DRAFT

| | |
|---|---|
| | බලතල කටයුතු හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම අනුමත කිරීමේ බලය කොමසාරිස්වරයා සතුවේ. |
| **36 අ (4)** උපවගන්තිය | විෂයභාර අමාත්‍යවරයා විසින් හෝ පළාත් පාලන කොමසාරිස් වරයා විසින් කලින් කල වාණිජ හෝ කාර්මික ව්‍යවසායක නියුක්ත වී සිටින යම් නගර සභාවකට එකී ව්‍යාපාරය පවත්වාගෙන යාම හෝ ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ විධාන දෙනු ලැබිය හැකි අතර, සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය . |
| **39(2)** උප වගන්තිය | සභාවේ වියදමක් සිදුවන කාර්යයක් හෝ වැඩක් සම්බන්ධව වූ යම් ගිවිසුමක් අනුමත කිරීම සභාව විසින් පැහැර හැරිය හොත්, සභාපති වරයාට එම ගිවිසුමට ඇතුලත් වීම සඳහා අනුමැතිය දීම. |
| **174** අ වගන්තිය | නගර සභාවට නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීමේ කාර්යය සඳහා හෝ අවශ්‍ය යැයි සභාපතිවරයා සලකන යම් වැඩක් කිරීමේ කාර්ය සඳහා ණයක් ලබා ගැනීම, අනුමත කිරීම සභාව විසින් පැහැර හරිනු ලැබුවහොත් සභාපතිවරයා විසින් අනුමැතිය ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම. |
| **176 (1)** වගන්තිය | නගර සභාව විසින් පවත්වාගෙන යායුතු ගිණුම් පොත් වල ආකෘති හඳුන්වා දීමට හා එකී ආකෘති අනුව ගිණුම් පොත් තබා ගත යුතු බවට නියම කිරීම |
| **177 (1)** වගන්තිය | වාර්ෂික අවසාන ගිණුම් පිළියෙළ කිරීම හා ප්‍රසිද්ධ කිරීමට අනුමැතිය ලබා දීම |
| **178(1)** වගන්තිය | අයවැය ලේඛණය පිළියෙළ කිරීමට අදාල ආකෘති නියම කිරීම |
| **180(1) (2)** වගන්තිය | නගර සභාවක් විසින් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු හැකිතාක් ඉක්මනින්, පළාත් පාලන කොමසාරිස් වරයා විසින් නියම කරනු ලබන ආකෘතියකින් යුක්ත වාර්ෂික පරිපාලන වාර්තාවක් පිළියෙළ කර ඉදිරිපත් කිරීම |
| **183(3)** සහ **(5)** උප වගන්ති | විගණන අධිභාරයකට විරුද්ධව අභියාචනා සම්බන්ධ කටයුතු කිරීම හා එකී අධිභාර බලාත්මක කිරීම හා අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම. |
| **184(1) (ඇ)** වගන්තිය | අමාත්‍යවරයාගේ නැතහොත් පළාත් පාලන කොමසාරිස් වරයාගේ නියමයන්ට, උපදෙස් |

DRAFT

| | |
|---|---|
| | වලට හෝ නිර්දේශයන්ට සභාපතිවරයා හෝ සභාවක් හෝ නගර සභාවක යම් සභිකයෙකු හෝ නිරතුරුවම අකීකරුවීම නැතහොත් ඒ නියමයන්, උපදෙස් හෝ නිර්දේශ නොතකා හැරීම පිළිබඳව ප්‍රමානවත් සාක්ෂි ඇති බව අමාත්‍යවරයා වෙත පෙන්වා දීම<br><br>✶ එවන් අවස්ථාවක එවන් සභාපතිවරයෙකු/ සභිකයකු ධූරයෙන් ඉවත් කිරීමට හෝ සභාව විසුරුවා හැරීමට අමාත්‍යවරයා වෙත බලය වන බව සැලකිල්ලට ගත යුතුය. |
| **191(2)** වගන්තිය | **188** වගන්තිය යටතේ වියදම් කරනු ලබන ණය මුදලක් ලබා දීමට ප්‍රාදේශීය ණය සහ සංවර්ධන කොමසාරිස්වරයකු ලෙස හිමි වන බලය. |
| **195** වගන්තිය | යම් නගර සභාවක් විසින් පරිපාලනය කරනු ලබන නගරය ඇතුලත, පොදු සෞඛ්‍යාරක්ෂාව හා පොදු ආරක්ෂාව අරභයා ගතයුතු ප්‍රතිපත්ති පිළිබද යෝජනාවන් ඉදිරිපත් කිරීම |
| **196** (අ) (ආ) (ඇ) | • නගර සභාවක් විසින් හෝ එහි පාලනය යටතේ හෝ පාවිච්චි කරනු ලබන, පරිහරණය කරනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන යම් පොදු ගොඩනැගිල්ලක්, නිශ්චල දේපලක්, හෝ ආයතනයක් හෝ නගර සභාවේ විධානය යටතේ කරගෙන යන යම් වැඩක් පරික්ෂා කිරීම<br><br>• නගර සභාවක සන්තකයේ හෝ පාලනය යටතේ ඇති පොත්පත් හෝ ලේඛණ ගෙන්වා පරික්ෂා කිරිම,<br><br>• සභාවේ හෝ සභාවේ යම් කාරක සභාවක කටයුතු වලට හෝ කාර්යයන්ට අදාළ ප්‍රකාශ, ගිණුම් වාර්තා, හෝ ලේඛණ වල පිටපත් ඉල්ලා සිටීම. |
| **197** වගන්තිය | පළාත් පාලන කොමසාරිස්වරයාට හෝ තත් කාර්ය සඳහා බලය ලබා දෙන ලද නිලධාරියෙකුට නගර සභාවේ සභාපතිවරයා විමසා, නගරසභාව විසින් පරිපාලනය කරනු ලබන නගරය ඇතුලත තම තමන්ගේ කර්තව්‍යය යථා පරිදි ඉටු කිරීම සඳහා නගර |

සභාවේ නිලධරයන්ට ඇති පරිදිම ඇතුළු වී පරික්ෂා කිරීමේ බලය හා අධිකාරය ඇත.

**198** වගන්තිය නගර සභාවේ කටයුතු හා ක්‍රියාකාරිත්වය පිළිබඳව වාර්ෂික සමීක්ෂණයක් කර, නිරීක්ෂිත තොරතුරු අන්තර්ගත වාර්තාවක් පිළියෙළ කර සභාගත කිරීම සඳහා නගර සභා සභාපති වෙත යොමු කිරීමේ බලය.

**199** වගන්තිය නගර සභාවේ වාර්ෂික අයවැය ලේඛණය හා එකී අයවැය ලේඛනයේ සිදු කරන යම් වෙනස් කිරීම් හෝ ඒ හා සම්බන්ධිත සියලු වාර්තා හෝ විස්තර, ලබා ගැනීමට ඇති බලය .

**201** වගන්තිය නගර සභාවේ කටයුතු පිළිබඳව සමාලෝචනයක් කර වාර්ෂිකව පරිපාලන වාර්තාවක් පිළියෙල කොට පල කිරීම කොමසාරිස්වරයාගේ කාර්යයක් වේ. ඒ සෑම වාර්තාවක්ම සහ සමාලෝචනයක්ම පාර්ලිමේන්තුව ( වර්මානයේ පළාත් සභාව) වෙත ඉදිරිපත් කරනු ලැබීය යුතු.අතර කොමසාරිස් වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයකට ප්‍රසිද්ධියට පත් කල යුතුය.

**202** වගන්තිය .

නගර සභා 2ක් හෝ කිහිපයක් අතර හෝ නගර සභාවක් සහ වෙනත් පළාත් පාලන ආයතන අතර ඒවායෙහි අයිතිවාසිකම්,බලතල,කාර්යය හෝ බැදීම් පිළිබද යම් ප්‍රශ්නයක් පැන නැගුන අවස්ථාවක සියලු පාර්ශවයන් එකග වුවහොත් සියලු පාර්ශවයන් එකග නොවන අවස්ථාවක යම් පාර්ශවයක ඉල්ලීම මත හෝ එම ආරවුල අමාත්‍යවරයා විසින් කොමසාරිස්වරයාට යොමු කල හැක. එහිදී එම කාරණා සම්බන්ධයෙන් අවසන් නියමයක් කිරීමේ බලය කොමසාරිස්වරයා සතු වේ.

**204** වගන්තිය

යම් නගර සභාවක් තුල සිදුවන යම් කරුණක් සම්බන්ධයෙන් නගර සභා ආඥාපනත යටතේ නොවන වෙනත් නීතියක් යටතේ අමාත්‍යවරයා වෙත පැවරී ඇති යම් බලයක් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරන ලද නියමයක් මගින් කොමසාරිස්වරයා වෙත පැවරීමෙන් අනතුරුව එවන් බලතල ක්‍රියාත්මක කිරීම.

DRAFT

| | |
|---|---|
| **241** වගන්තිය | නගර සභාව විසින් කරනු ලබන යෝජනා සම්මතයක් මත තීරණය වන සේවක වැටුප්, විශ්‍රාම වැටුප් පිළිබඳව අතෘප්තියට පත් යම් නිලධරයෙකු හෝ සේවකයෙකු විසින් ඉදිරිපත් කරන අභියාචනා භාර ගෙන ඒ පිළිබඳව කොමසාරිස්වරයා විසින් නගර සභාව විසින් ගනු ලැබිය හැකි අන්දමේ සුදුසු විධිවිධාන නියමයක් මගින් සැලැස්වීම. |

**4.3** <u>**1987** අංක **15** දරණ ප්‍රාදේශීය සභා පනත යටතේ පැවරී ඇති බලතල හා වගකීම්.</u>

| නෛතික යොමුව | බලතල හා කාර්යය |
|---|---|
| **19(1) (1)** වගන්තිය | ප්‍රාදේශීය සභාවට අවශ්‍ය යැයි සලකන සියළු තනතුරු හෝ නිල ඇති කිරීමට සභාව තීරණය කිරීමේදී ඒ සඳහා පළාත් පාලන කොමසාරිස් වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා දීම. |
| **19(3)** වගන්තිය | යම් වාණිජ හෝ කර්මාන්ත ව්‍යවසායක නිරත යම් ප්‍රාදේශීය සභාවක් වෙත, එය පවත්වාගෙන යාම හෝ, එහි කටයුතු කරගෙන යාම හෝ පිළිබඳව සාමාන්‍ය හෝ විශේෂ විධාන ලබාදම. |
| **19(4)** වගන්තිය | සභාව විසින් පවත්වාගෙන යන වාණිජ හා ව්‍යවසාය වලට අදාළ වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු සභාවෙන් ලිඛිතව ඉල්ලා විධාන කිරීමේ බලය |
| **124** වගන්තිය | ප්‍රාදේශීය සභාවට අදාලව ප්‍රාදේශීය සභා පනත යටතේ සාදන ලද සියළුම අතුරු ව්‍යවස්ථාවල පිටපත් මහජනතාවගේ පරීක්ෂාවට විවෘතව තැබීම විකිනීමට විධිවිධාන යෙදීම. |
| **172(8)** වගන්තිය | විගණකාධිපති විසින් යම් තැනැත්තෙකු වෙත අධිභාර සහතිකයක් නිකුත් කිරීමෙන් අනතුරුව අභියාචනයක් ඉදිරිපත් කර නොමැති විටෙක අදාල අධිභාර මුදල දින **14** ක් තුල ලබා ගැනීම |
| **172 (9) (10)** වගන්තිය | යම් තැනැත්තෙකු විසින් ගෙවිය යුතු අධිභාර මුදල පළාත් පාලන කොමසාරිස් වෙත ගෙවනු නොලැබුවහොත්, එය අධිකරණය වෙත යොමු කර, එකී අධිභාර මුදල දඩයක් ලෙස අයකර ගැනීම |
| **172 (11)** වගන්තිය | අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කරනු ලැබූ යම් නියමයක් මගින් යම් තැනැත්තෙකුගෙන් අයකර ගනු ලැබීමට විධාන කරන ලද යම් මුදලක් විගණන අධිභාරයක් අයකර ගනු ලබන |

DRAFT

| | |
|---|---|
| | ආකාරයට එකී මුදල  අදාල තැනැත්තාගෙන් වහාම අයකර ගැනීම.. |
| **175 (1) (2)** වගන්තිය | සභාවක යෝජනා සම්මතයක් මඟින් බලය දෙනු ලැබූ යම් වැය විෂයක නීත්‍යානුකූලභාවය පිළිබඳ පළාත් පාලන කොමසාරිස් වරයාගේ නිගමනය සහකාර කොමසාරිස්වරයා මඟින් අදාල පළාත් පාලන ආයතනය වෙත දැනුම් දීම |
| **181** වගන්තිය | සභාවට පැවරී ඇති යම් කාර්යයක් ඉටු කිරීමේ හෝ යම් කටයුත්තක් කරගෙන යාමේ කාර්යය සඳහා ණයක් ලබා ගැනීම සභාව විසින් අනුමත නොකල අවස්ථාවකදී ණය අයදුම්පත් අනුමත කිරීමේ බලය |
| **191(1)** වගන්තිය | දේශීය ණය සංවර්ධන කොමසාරිස්වරුන් විසින් ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ණය මුදල් පළාත් පාලන කොමසාරිස් වරයාට  ලබාදිය හැකිය. |
| **191(2)** වගන්තිය | ණය සඳහා ප්‍රාදේශීය සභා වරිපනම් සහ බදු උගසට ගැනීමේ බලය. |
| **193** වගන්තිය | ප්‍රාදේශීය සභා පනත මගින් හෝ ඒ යටතේ පළාත් පාලන කොමසාරිස් වෙත පවරා ඇති හෝ නියමකර ඇති යම් බලයක්,  කාර්යයක් හෝ කර්තව්‍යයක් සහකාර කොමසාරිස් වරයාට පැවරීමට බලය ඇත. |
| **195** වගන්තිය | මහජන සෞඛ්‍ය හෝ ආරක්ෂාවේ යහපත උදෙසා වූ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිර්දේශයන් ඉදිරිපත් කිරීමට පළාත් පාලන කොමසාරිස්වරයාට බලය ඇත. |
| **196 (1) (අ)** වගන්තිය | ප්‍රාදේශීය සභාවක් මගින් හෝ  එහි පාලනය යටතේ භාවිතා කරන හෝ පදිංචිව සිටින යම් පොදු ගොඩනැගිල්ලක්  නිශ්චල දේපලක් හෝ ආයතනයක් නැතහොත් ප්‍රාදේශීය සභාවේ විධානය යටතේ කරගෙන යන යම් වැඩක් පරීක්ෂා කිරීමට බලය ඇත. |
| **196 (1) (ආ)** වගන්තිය | ප්‍රාදේශීය සභාවේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති හෝ ලේඛන කිසිවක් ඉල්ලා සිටීමට හා පරික්ෂා කිරීමට හෝ භාරයට ගැනීමට බලතල ඇත. |
| **196 (1) (ඇ)** වගන්තිය | ප්‍රාදේශීය සභාවක මුදල් හෝ වෙනත් දේපල පරීක්ෂා කිරීම සඳහා හෝ සත්‍යායනය කිරීම සඳහා  ඉදිරිපත් කරන ලෙස විධාන කිරීමට |

DRAFT

නෛතික බලතල පැවරී ඇත.

| | |
|---|---|
| 196 (1) (ඈ) වගන්තිය | ප්‍රාදේශීය සභාවේ පරිපාලනයට අදාල යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ ප්‍රාදේශීය සභාව මේ පනත හෝ වෙනත් යම් නීතියක් යටතේ වූ බලතල ක්‍රියාවේ යෙදවීම හා කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට හැකියාව ඇත |
| 196 (1) (ඉ) වගන්තිය | ප්‍රාදේශීය සභාවට හෝ එහි යම් කාරක සභාවකට අදාල වන්නාවූ ප්‍රකාශ, ගිණුම්, වාර්තා හෝ ලේඛන වල පිටපත් ඉදිරිපත් කරන ලෙසට යම් ප්‍රාදේශීය සභාවකට නියම කිරීමට බලතල පැවරී ඇත. |
| 197 වගන්තිය | පළාත් පාලන කොමසාරිස්වරයා විශේෂයෙන් පවරන ලද නිලධාරියෙකු මඟින් බලතල ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත. |

## 4.4 2012 අංක 22 දරණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ (සංශෝධන ) පනත යටතේ පැවරී ඇති බලතල, වගකීම් හා කාර්ය භාරය

යථෝක්ත පනතේ 66 ඇ (1) හා (2) වගන්ති වල ඇති නෛතික විධිවිධානයන් අනුව පහත දැක්වෙන කාර්යයන් ඉටු කිරීම පළාත් පාලන කොමසාරිස් වෙත පැවරී ඇත.
“යම් පළාත් පාලන ආයතනයක සමස්ථ ආසන සංඛ්‍යාවෙන් 50% කට අඩු සංඛ්‍යාවක් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් විසින් ලබාගෙන ඇති අවස්ථාවක දී එම පළාත් පාලන ආයතනයේ නගරාධිපති වරයා හෝ සභාපති වරයා තේරීමේ කාර්ය භාරය ”

DRAFT

## 05. පළාත් පාලන සහකාර කොමසාරිස් වරයා සතු බලතල හා වගකීම්

පළාත් පාලන ආයතන සංස්ථාපිත ප්‍රධාන අණ පනත් අනුව, පළාත් පාලන සහකාර කොමසාරිස් වරයාට බලතල පැවරී ඇත්තේ නගර සභා සහ ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් පමණක් වේ.

### 6.1 255 අධිකාරය වූ නගර සභා ආඥා පනත යටතේ පළාත් පාලන සහකාර කොමසාරිස් වරයාට පැවරී ඇති බලතල

පහත දැක්වෙන අවස්ථාවලදී නගර සභාවක් සම්බන්ධව කාර්යයන් ඉටු කිරීමට සහකාර කොමසාරිස් වරයාට බලතල හා වගකීම් පැවරේ.

| නෛතික යොමුව | බලතල හා කාර්යය |
|---|---|
| 184(1ආ) (i) සහ (iii) උප වගන්ති | 184(1) වගන්තියේ සඳහන් ප්‍රතිපාදන යටතේ නගර සභාවක සභාපති වරයාගේ ධූරය තාවකාලිකව නතර කර ඇති විට, එම කටයුතු ඉටු කිරීමට උප සභාපතිවරයාද නොමැති විටෙක (උප සභාපතිවරයාගේ ධූරයද නතර කර තිබීම හෝ එම ධූරය හිස්ව තිබීම) විෂයභාර අමාත්‍යවරයාගේ නියමය පිට නගර සභා සභාපති වරයාගේ කාර්යයය ඉටු කිරීම<br><br>නගර සභාව විසුරුවා ඇති විටෙක හෝ නගර සභාවම අත්හිටුවා ඇති විටෙක අමාත්‍යවරයාගේ නියමය පිට සභාවේ සභාපතිවරයාගේ කාර්යය ඉටු කිරීම |

## 6.2 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත යටතේ සහකාර කොමසාරිස් වරයාට පැවරී ඇති බලතල හා වගකීම්.

| නෛතික යොමුව | බලතල හා කාර්යය |
|---|---|
| 10(4) වගන්තිය | ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක් ලැබී දින 7 ක් ඇතුලදී විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීම සභාපතිවරයා ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ හිතාමතාම පැහැර හරිනු ලැබුවහොත් ඉන් ඉක්බිති ඕනෑම අවස්ථාවක පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා විසින් විශේෂ සභා රැස්වීමක් කැඳවීමටත් එකී රැස්වීමේ මුලසුන දැරීමට හෝ මුලසුන දැරීමට වෙනත් නිලධරයෙකු යෙදවීමත් නිත්‍යානුකූල වේ. |
| 133 වගන්තිය | ප්‍රාදේශීය සභා අරමුදලින් දරනු ලබන සියළු ගෙවීම් සඳහා වූ චෙක්පත් හෝ අණකර පළාත් පාලන සහකාර කොමසාරිස් වරයාගේ අනුමැතියට යටත්ව, තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් විශේෂයෙන් බලය පවරන ලද නිලධරයන් දෙදෙනකු විසින් අත්සන් කරනු ලැබිය යුතුය. |
| 134 (1) වගන්තිය | ප්‍රාදේශීය සභා පාලන බල ප්‍රදේශය තුල පිහිටි වරිපනම් බද්දට යටත් නොවන්නාවූ ආර්ථික හා යටිතල පහසුකම් වලින් යුත් දියුණු වූ ප්‍රදේශ ප්‍රාදේශීය සභාව විසින් හඳුනා |

DRAFT

| | |
|---|---|
| | ගැනීමෙන් අනතුරුව එය දියුණු කළ ප්‍රදේශයක් ලෙස අනුමැතිය දී එය ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කිරීමේ නෛතික බලය හා වගකීම පළාත් පාලන සහකාර කොමසාරිස් වරයා සතු වේ. |
| **140(1)** වගන්තිය | ප්‍රාදේශීය සභාවක අලුතින් දේපල තක්සේරුවක් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් පත් කරනු ලබන ප්‍රධාන තක්සේරුකරු නොවන යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් විසින් තක්සේරු කිරීමේ කාර්යය කරවන්නේ නම් ඒ සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුව ඇත. |
| **148(6)** | ප්‍රාදේශීය සභා පනත යටතේ වාහන හා සත්ව බද්දට යටත් යම් වාහනයක් (පාපැදියක්/කරත්තයක් /අත් කරත්තයක්/ රික්ෂෝවක්) හෝ සතෙකු (අශ්වයෙක්/ පෝනියෙක්/කොටළුවෙක්/ඇතෙක්) ප්‍රාදේශිය සභා එකකට වඩා වැඩි ප්‍රාදේශිය සභා සීමාවන් ඇතුලත පාවිච්චි කරනු ලබන්නේ නම් එවැනි ප්‍රශ්ණගත අවස්ථාවකදී ඒ පිළිබඳ තීරණයක් දීමේ අධිකාරය ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් සතු රාජකාරි වගකිමක් වේ. |
| **171** (ආ) (ඇ) වගන්තිය | ප්‍රාදේශීය සභාවක වාර්ෂික අයවැය ලේඛනයට අදාල වගකීම් |
| **175 (1)** වගන්තිය | ප්‍රාදේශීය සභාවක යෝජනා සම්මතයක් මඟින් බලය දෙනු ලැබූ වැය විෂයක නීත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රාදේශීය සභාවක් කරනු ලබන විමසීමක් ගැන පළාත් පාලන කොමසාරිස් වරයාගේ නිගමනය, අදාල පළාත් පාලන ආයතනයට දැනුම් දීම පිලිබඳව වගකීම පැවරී ඇත්තේ පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත වේ. |
| **185 (3)** | සභාපතිවරයා සහ උප සභාපතිවරයා ගේ ධූරයන් දැරීම අත් හිටුවා ඇති අවස්ථාවකදී අමාත්‍යවරයාගේ නියමය අනුව සභාපතිවරයාගේ කාර්යය හා කර්තව්‍යයන් ඉටු කිරීමට ඇති බලය |
| **193** වගන්තිය | පළාත් පාලන කොමසාරිස්වරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් ලිඛිතව පවරනු ලබන බලතල පළාත් පාලන |

DRAFT

කොමසාරිස් වරයාගේ විධිවිධානයන්ට හා පාලනයට යටත්ව ක්‍රියාත්මක කිරීමේ හෝ ඉටු කිරීමට සහකාර කොමසාරිස්වරයාට බලතල ඇත.

**මෙම ලේඛනය සඳහා උදව් වූ පොත්**


1. **1987** අංක **15** කරණ ප්‍රාදේශිය සභා පනත
2. **255** අධිකාරය වූ නගර සභා ආඥා පනත
3. **252** අධිකාරය වූ මහා නගර සභා ආඥා පනත


DRAFT